# ප්‍රාදේශීය පරිපාලන කාර්යයන් ඉටුකර ගැනීමේ දී නව කළමනාකරණ ප්‍රවේශ සම්බන්ධයෙන් ජනතාව දක්වන උනන්දුව (ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඇසුරින්)

එන්. ඩබ්. බණ්ඩාරනායක[1]

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ පහළම පරිපාලන ස්ථරය වන්නේ, ප්‍රාදේශීය පරිපාලනයයි. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පරිපාලන අවශ්‍යතා සක්‍රීයව ඉටු කිරීමට 1992 අංක 58 දරණ පනත මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ක්‍රමය හඳුන්වා දෙන ලදි. එය සෑමවිටම ජනතා අවශ්‍යතා සමඟ අන්‍යෝන්‍ය වීම හේතුවෙන් ඉහළ අවධානයකට ලක් විය. පරිපාලන කාර්යයන් අධික වීමත් සමඟ එම කටයුතු කාර්යක්ෂම හා ඵලදායී අයුරින් ඉටු කිරීමට 90 දශකයේ දී නව කළමනාකරණ ප්‍රවේශ භාවිතයට පැමිණේ. වර්තමානය වන විට ප්‍රාදේශීය පරිපාලන කටයුතු සඳහා මෙය යොදා ගැනීමෙන් තෘප්තිමත් පරිපාලන සේවයක් මහජනතාව වෙත ළඟා කිරීමට අපේක්ෂා කෙරුණි. පූර්වෝක්ත පර්යේෂණ මාතෘකාව හරහා ප්‍රාදේශීය පරිපාලනයේ දී භාවිතා කරන නව කළමනාකරණ ප්‍රවේශ පිළිබඳ ජනතාව තුළ පවතින දැනුවත්භාවය අධ්‍යයනයට ලක් කිරීම අරමුණු කෙරේ. එහි දී ප්‍රාදේශීය පරිපාලන අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පැමිණෙන ජනතාවට නව කළමනාකරණ ප්‍රවේශ පිළිබඳ නිසි දැනුමක් හා අවබෝධයක් පවතිනවාද, යන්න මෙම අධ්‍යයනයේ ගැටලුව බවට පත් වේ. අධ්‍යයන නියැදිය ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය තෝරා ගත් අතර ප්‍රශ්නාවලියක් භාවිතයෙන් අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී. මෙහිදී ප්‍රාදේශිය පරිපාලනය තුළ භාවිතා වන නව කළමනාකරණ ප්‍රවේශ කිහිපයක් අධ්‍යයනයට ලක් කර ඇත. මෙම අධ්‍යයනයේ දී ප්‍රාදේශිය පරිපාලන අවශ්‍යතා ඉටු කර ගැනීමට පැමිණෙන ජනතාව නව කළමනාකරණ ප්‍රවේශ සම්බන්ධයෙන් දක්වන උනන්දුව හා අවබෝධය ඉතා පහළ මට්ටමක පවතින බව අනාවරණය කර ගත හැකි විය. මේ අනුව පරිපාලන කාර්යක්ෂමතාවය අරඹයා හඳුන්වා දුන් නව කළමනාකරණ ප්‍රවේශ භාවිතය සම්බන්ධව ජනතාවගේ ආකල්ප තවමත් හැඩගැසීමකට ලක් නොවී ඇති බව නිගමනය කළ හැකිය.

**මූඛ්‍ය පද**: ප්‍රාදේශිය පරිපාලනය, කාර්යක්ෂමතාව, ඵලදායීතාව, නව කළමනාකරණ ප්‍රවේශ

[1]ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය,
bandaranyakewathsala@gmail.com